චතුරංග වන ලැහැබෙන් මදක් ඈත් වී එළි පෙහෙළිව තිබූ බිම් තීරුව දෙස ක්‍ෂනික බැල්මක් හෙලා නැවත තමුන්ගේ හිස පිසුපසට ගත්තේ විදුලි වේගයකිනි. සමහර විට එසේ නොගත්තේනම් තමන්ට පෙනෙන අන්තිම දසුනද එය වීමට බොහෝ සෙයින් ඉඩ තිබුණි. වියලි වැලි කතරේ සැඟව සිටිනා ස්නයිෆර් තුවක්කු කටකින් පිටවෙන රත්වූ ඊයම් බරුවක් එල්ලය සොයා ඒමට ගතවන්නේ මිලි තත්පර ගනනකි. උදේ සිට කන්දොස් කිරියාවක් නොමැතිව ඇසුනු වෙඩිහඬවල් දැන් ඇසෙනුයේ ඉඳහිටය. මෙය වෙඩි හඬ ඇසෙන මොහොතට වඩා භයානක බව චතුරංග අත්දැකීමෙන්ම දන්නා කරුණකි. සතුරා එකවරම ඉදිරියට පැන හරහට දිගට වෙඩි තබන්නේ මෙවැනි මොහොතකය.

චතුරංග නැවතත් තමන් ආ මග දෙස බලා සගයා සිටින ඉසව්ව දෙසත් නෙත් යොමු කලේය. ඔහු විශාල තුඹසකට හේත්තු වී නිදා සිටිනු දැකීමෙන් හෙතෙම කෝපයට පත්විය. ඔහුට දත් මිටි කැවුනි.

මේ මෝඩයා ඉන්න හැටි. හදිසියෙන් ෆයර් කලොත් මූට ගන් එක අත තියන්නවත් ලැබෙන්නේ නෑ.

චතුරංග තමාටම කියා ගත්තේය. එහුට එකවරම තමන්ගේ බාල සොහොයුරු මතකයට පිළිපන්නේය. ඔහුත් තම සගයාත් එකම වයසේ බැව් වැටහීමෙන් ඔහුගේ කෝපය මදකට තුනී විය.

පව් අහින්සක කොල්ලෝ ගෙදර පව්වලට කරගහන්න යුද්ධෙට ඇවිල්ලා.

චතුරංග නැවතත් වන බූටෑවට ආවරනය වෙමින් තම සගයා සිටිනා ඉසව්ව බඩගාන්න වූවේය. ඔහු සගයා වෙතට පැමිණ මහන්සි හරින්නට විය.

අයියේ

ඒ හඬින් චතුරංග ගැස්සී ගියේය. ඔහු දෙස බැලූ චතුරංගට යමක් වැටහුනේය. ඔහු තමාගේ පිටි අල්ල සගයාගේ නලලත තබා බැලුවේය.

දෙයියෙනේ මූට සහලවලා උන

ඔහු තමාටම කියා ගත්තේය.

මල්ලි පෙත්තක් ගත්තේ නැද්ද?

වතුර ඉවරයි අයියේ.

තරුණයා කෙඳිරිලි අතරින් කියා සිටියේය. චතුරංග තමාගේ සැහැල්ලුවේ ඇති වතුර බෝතලය ගෙන සොලවා බැලීය. එහිද එක් දිය කඳුලකුදු නොමැති බව පසක් වීමෙන් පසු ඔහුගේ දෙනෙත් හිස් ආකාශය දෙසට යොමුවුණි.

අයියේ මං මැරෙයිද?

චතුරංගගේ සිතිවිලි දැහැන තරුණයා එකවරම කඩා බිඳ දැම්මේය.

පිස්සු කෙලින්නැතිව හිටපන්. උන ටිකක් වැඩි උනාම මිනිස්සු මැරෙනවද?

චතුරංග ඔහු අස්වසාලීය.

උඹේ නම මොකක්ද?

සාලිය.

මහ ලවුඩු නමක්නෙ දාලා තියෙන්නේ.

චතුරංග සිනාසෙමින් කීවේය. එය ඇසූ සගයාගේ වේදනාබරිත මුහුණේ සිහින් සිනා රැල්ලක් ඇදෙන දෙස ඔහු බලා සිටියේ සතුටිනි.

උඹට කැල්ලක් ඉන්නවද මලේ.

චතුරංග තම පලපුරුද්ද ප්‍රයෝජනයට ගෙන තරුණයාගේ අසනීප තත්වය මදකට අමතක කරණු වස් අසා සිටියේය.

ඉන්නවා අයියේ.

තරුණයාගේ මුහුණට වැටුනු ආලෝකය දෙස චතුරංග බලා සිටියේ මහත් සතුටිණි.

කොහොමද ලස්සනද?

තරුණයා සියළුදේම මොහොතකට අමතක කරමින් ලජ්ජාවෙන් සිනාසුනේය.

ඉතිං කියපන්කො ලස්සනද?

කියලා වැඩක් නෑ අයියේ එළකිරි.

මොහොතක් ප්‍රාභාවමත්ව තිබූ තරුණයාගේ මුහුණ මදක් වේදනා භරිත විය.

අයියේ මට අමාරුයි. සීතල උහුලගන්න බෑ.

තරුණයා නැවතත් කෙඳිරිගාන්නට වුනි.

දැන් ඉතින් වතුර හොයපන්කෝ

චතුරංග පුරුදු පරිදි තමන්ට කියා ගත්තේය. ඔහු නැවතත් තුවක්කුව කරේ එල්වාගෙන බූටෑවට මුවාවෙමින් ජලය සොයා බඩ ගාන්නට විය. මෙවර ඕහු මුඩු බිම් තීරුවකට එක් වරම පැන අනිත් පැත්තට පෙරලී පැන ගත්තේය. ඔහු වහ වහා බඩගාමින් ජලය සොයා යන්නට විය. මද වේලාවකින් චතුරංග හති දමන්නට විය. ඔහු මදකට තම ගමන නවතා බිම දිගා විය. වන පඳුරු වලට ඉහලින් පෙනෙන සැන්දෑ අහස්කුස දෙස බලා ඔහු කල්පනාවේ නිමග්න විය. ඔහුට ගම මතක්විය. මෙවැනි සඳෑවක ඔහු සිටින්නේ වෙල මැද ඇති දිය පිහිල්ලේය. සුමිත්‍රා දිය නානතුරු ඇගේ තනියට ඔහු පීල්ල අසල දවටෙයි. ජලයෙන් පෙඟී ඇඟට ඇළුනු දියරෙද්දෙන් සැරසී සිටින සුමිත්‍රා ඔහුගේ මතකයට ආවේය. ඔහු දිග සුසුමක් ලය පුරාගෙන සෙමින් මුදවා හැරියේය. මෙම සිතිවිලි ගොන්නේ අවසානය දුකක් මිසක් වෙනකක් නොවන බව සිහිවීමෙන් ඔහු නැවතත් තම සගයාට ජලය සෙවීම සඳහා ගමන ආරම්භ කලේය. මදක් දුර ගොස් ඔහු එකවරම නැවතී වටපිට බලන්නට විය. ඔහු ඉදිරියේ තිබුනේ වැස්සට ජලයෙන් පිරී තිබූ දිය කඩෙකි. මෙවැනි තැන් සොයා සතා සීපාවාට මෙන්ම සතුරාටද පොදු ස්ථානයක් බව අමුතුවෙන් කියා දිය යුතු වූ කරුණක් නොවීය. ඔහු තවත් මොහොතක් නතර වී වටපිට බලන්නට විය. ඔහු පටන්ගත් සිතුවිලි නැවත ඔහු සොයා පැමිණියේය. සුමිත්‍රා දැන් මොනවා කරනවා ඇතිද? ඔහු පිළිතුරු එකින් එක ගෙන විමසා බැලීය. අවසානයේ ඔහු නිගමනයකට එලඹීය.

අනිවාර්යෙන්ම ලමයි නලවනවා ඇති.

සුමිතා දවසක්ම තමාට තුරුළු වී සිටි අන්දම ඔහු නැවතත් ආවර්ජනය කලේය. ඇගේ දෙකොපුල් කොතරම් සියුමැලිද?

දෙකොපුල් සිඹින විට ඒවා රත් පැහැයට හැරුනු අන්දම ඔහුට පෙනෙන්නාක් මෙන් විය. නා දළු වන් දෙතොල් සිප ගත්තේ කොතරම් ගෞරවනීය අන්දමින්ද? ඇය තමාගේ උඩු කයට සිරවී තිබූ අන්දම මතක්වී ඔහුගේ ශරීරය උනුසුම් වන්නට වූයේය.

වැඩක් නෑ.

ඔහු තමාට කියා ගත්තේය. ඇය තමා අත්හැර වෙනත් දීගෙක ගිය අන්දම මතක්කොට ගනිමින් හිතට ආ දර්ශන පෙලින් හෙතෙම ඉවත් වූවේය. ඒ සමගම නෙතින් අමතකව ගැලූ කඳුලු කැට දෙකක් නිල කබායට වැටී නොපෙනී ගියේය.

තෙල් පැණි ඇත්නම් කැවුංද පඤ්ඤං

අතමිට ඇතිනම් ගෑනද පඤ්ඤං



# සොල්දාදුවා

ගමේ එලවළු විකුණු සයිමන් මුදලාලිගෙ උපහැරනයකින් ඔහු තිරය වසා දැම්මේය.

ඔහු නැවතත් තම සගයාගේ ප්‍රශ්නය සියතට ගත්තේය. ඒ සමගම දුටු දෙයින් ඔහු තරමක් තැති ගත්තේය. දිය කඩිත්ත දෙසට බඩ ගාමින් එන සතුරා ඔහු දුටුවේ අහම්බෙනි. සතුරා පිළිග ැනීමට ඔහු වහ වහා සූදානම් විය. ඔහුටද ශබ්දය නොනැගෙන අන්දමින් ඔහු තුවක්කුව ස්වයංක්‍රීය තත්වයට පත් කරගත්තේය. දිය කඩිත්තේ සතුරා එන ඉසව්වේ හොඳම ස්ථානයක් බලා තුවක්කුව මැනුවේය. මැනුමට එල්ලය එනතුරු හෙතෙම නොඉවසිල්ලෙන් කල් මරන්නට විය. ඔහු සතුරා දෙස නැවතත් නිරීක්‍ෂණයක යෙදුනේය. සතුරා අත කිසිදු ආයුධයක් නොවීය. තිබුනේ හිස් වතුර බෝතලයක් පමණි. ඔහු නැවතත් සතුරා දෙසට තුවක්කුව එල්ලකොට ගත්තේය. ඔහුගේ සිත සන්සුන් කමකින් වෙලෙන්නට විය.

නිරායුධ මිනිහෙක්; අනික වතුර පිපාසයෙන් පීඩිතව ඉන්නා කෙනෙකුට වෙඩි තියන්නෙ කොහොමද? චතුරංගගේ සිත ඒකාග්‍රතාවයෙන් මිදුනේය. ඔහු ගමේ දඩයක්කකරු කිරි බණ්ඩා මතක් විය. ඔහු දෙඩූ වදන් දැන් දැන් ඇසෙන්නාක් මෙන් විය.

මලේ මම කිසිදාක වතුර බොන සතෙකුට වෙඩි තියන්නේ නෑ. සතා වතුර බීලා යන්ට යනකොට තමයි වෙඩි තියන්නේ.

ගමේ දඩයක්කරු වුවද පිළිපදින නීති රීති සම්ප්‍රදායක් ඇති බව මතක් වීමෙන් සතුරාට වෙඩි තබන අදහස මදකට නවතා ඔහු දෙස බලා ඉන්නට විය. සතුරා ඉක්මනින් ජලය පානය කර තම බෝතලයටද එකක් පුරවා ගෙන ආපසු යන්නට හැරුනේය. චතුරංගගේ හිතට වියරු අදහසක් පහල වූයේ නිතැතිණි. ඔහු ඒ මොහොතේම ක්‍රියාත්මක කලේය.

හෝල්ට්

චතුරංග සතුරා ඉදිරියට පැන තුවක්කුව එල්ල කලේය. සතුරා බියට පත් වී මුනින් වැටී දිගා විය. ඔහොමම ඉස්සරහට වරෙන්.

සතුරාට ඉදිරියට එනවා ඇරෙන්න කලයුතු වෙනත් කිසිවක් නොවීය. ඔහු බඩගාගෙන අවුත් චතුරංග ඉදිරියේ දනින් සිටගත්තේය. චතුරංග තුවක්කුව ඔහු දෙසට එල්ල කරමින්ම කථා කරන්නට විය.

උඹලගේ අනිත් එව්වෝ කොහේද? ඉක්මනට කියපන් ?

සේරමලා දිව්වා. මායි කුටාලියි ඉතිරි උනා.

උඹ ඔය ඇත්තද කියන්නේ ? කෝ එතකොට උඹගේ කුටාලි ?

එයාට ෂනීප නේ. කෙලේ ඉන්නවා ඌට වතුර ගෙනියාන්න තමයි ආවා.

ඉතින් ඌට බෙහෙත් දුන්නේ නැද්ද ?

බෙහෙත් නෑ අයියා. ඌට වතුර ටිකක් වත් දෙන්න ඕන ඉන්දා ආවේ.

ඇයි උඹේ කරේ එල්ලගෙන ඉන්නේ බේත් කරලක්. ඒක දීපන්.

චතුරංග සතුරා කර පැලඳ ඇති සයනයිඩ් කරල පෙන්වමින් උපහාසයෙන් අසා සිටියේය.

තව ටිකක් බලාලා ඌම මරන්ඩු කයි අයියා.

සතුරා බිම බලාගෙන උත්තර දුන්නේය. සතුරා තම සගයා ගැන දුක්වන්නේ යැයි චතුරංගට සිතිණි. තම සගයින් පසු බසිද්දී තම යහළුවා වෙනුවෙන් නතර වූ ඔහු ගැන සියුම් ගෞරවයක් චතුරංගගේ සිත තුළ හට ගත්තේය. ඔහ තමන්ගේ සෑහැල්ලුවේ තිබුනු සියල්ල ඉවතට ගෙන බෙහෙත් පෙති කිහිපයක් සොයා සතුරාගේ සුරතේ තැබීය. ඔහු එය දෑතින් ඔසවා නලලත තබා නැවත පාත් කොට තම ස්තූතිවන්ත භාවය චතුරංග වෙත පුද කලේය.

රොම්බ නන්රි අයියා

සතුරා තම සැහැල්ලුවෙන් ඉවත් කල කෑම පැකට් කිහිපය දෙස කෑදර කමින් බලා සිටිනවා චතුරංග ඇස් කොනින් දුටුවේය.

ඇයි උඹලට කෑම නැද්ද?

චතුරංග ඇසුවේ බලා සිටින්නට බැරිම තැනය.

රෙන්ඩු නාල්ලේ ඉරින්දි ඔන්නුම් ඉල්ලෙ අයියා.

චතුරංග තමා ලඟ තිබූ කෑම පැකට් දෙකක්ද සතුරාට දුන්නේය. කෑම පැකට් දෙකද නලලත තබා නැවත පාත් කොට තවත් වරක් චතුරංග වෙත තම උපහාරය පුදකොට සිටියේය.

නාන් පොයිට් වාරෙන් අයියා.

ඔය වතුර එක දීලා පලයන්

චතුරංග තරමක ශබ්දයෙන් කියා සිටියේය. සතුරා දෑතින්ම වතුර බෝතලය පිරිනමා සිටියේය. ඔහු වතුර බෝතලය ගෙන තමන්ගේ බෝතලයට වත්කර හිස් බෝතලය නැවත ආපසු දී ඔහුට යන ලෙස අතින් සන් කලේය. සතුරා බිම බඩගාමින් වහ වහා යන්නට විය. එකවරම ඔහු නැවතී චතුරංග දෙස බැලුවේය. ඔහු එලෙස බැලුවේ තමා ඔහුට වෙඩි තබාවිය යන සැකය නිසා බව චතුරංග ට වැටහිණි.

උඹ බය නැතිව පලයන් ආයුධයක් අතේ නැති එකෙකුට වෙඩි තියන්න තරම් හිකනැල්ලු නෙවේ අපි.

එසේ කියා චතුරංග තම සොල්දාදුකමේ මහත්මාකම සතුරාට කියා පෑවේය.

අයියගේ නම කෝමද?

සතුරා අසා සිටියේය.

දුන්නම කන්නා

චතුරංග සිනාවෙමින් කියා සිටියේය.

උඹේ නම ?

සිව කුමාර්

සතුරා මුමුනමින් යන්නට ගියේය. චතුරංග ද ආපසු හැරී තම සගයා සොයා ගමන ආරම්භ කලේය. මිය යාමට ආසන්න හිරුගේ රතු පැහැති රැස් වැටී සාලියගේ වේදනා බරිත මුහුණ තවත් පැහැදිලිව චතුරංගට පෙනුනි. ඔහු රෝගියා කෙලින් කරවා බෙහෙත් පෙති දෙකක් මුවට දමා වතුර බෝතලයෙන් වතුර ස්වල්පයක් කටට වත් කොට නැවතත් හාන්සි කලේය. විනාඩි කිහිපයක් දෑස වසාගෙන සිටි අතර සැඳෑ එලිය රාත්‍රිය විසින් ක්‍රම ක්‍රමයෙන් ගිල ගනිමින් සිටින්නට විය. අවසානයේ සාලිය ඇස් ඇර චතුරංග දෙස බලා මද සිනාවක් පෑවේය.

දැන් කොහොමද ?

දැන් නම් ඇඟ් අමාරුව අඩුයි අයියේ.

අපි එහෙනම් කොහොමහරි කෑම්ප එකකට යන්න බලමු.

හොඳයි අයියේ.

චතුරංග සහැල්ලුව ගලවා දමා ඇග මැලි කඩමින් සිටි තැනින් නැගිට්ටේය. බටහිර අහසේ රත්වූ වළාකුල් කිහිපයක් බැබලෙමින් තිබුණි. ඒවායේ මනස්කාන්ත බව බලමින් සිටි චතුරංගට සටන් බිමේ කාලය මදකට අමතකව ගියා සේ දැනුණි.

සංග්‍රාමයේදී ඉක්මන්වන තැනත්තා හැමදාමත් දිණුම්ය. ප්‍රමාද වන්නා කෙරෙහි කවදාවත් එළඹියේ මරණයයි.

ඈත තල් ගසක් උඩ දින ගනනක් වෙහෙසව සිටි ස්නයිෆර් තුවක්කු කටකින් පිටව ආ රත් වූ ඊයම් ගුලියක් චතුරංගගේ වම් උරහිස පැත්තෙන් ශරීරයට ඇතුළු විය.ඔහු වේදනාවෙන් මුනින්තලාවී

> ***ඇය තමා අත්හැර වෙනත් දීගෙක ගිය අන්දම මතක්කොට ගනිමින් හිතට ආ දර්ශන පෙලින් හෙතෙම ඉවත් වූවේය. ඒ සමගම නෙතින් අමතකව ගැලූ කඳුලු කැට දෙකක් නිල කබායට වැටී නොපෙනී ගියේය.***
> ***තෙල් පැණි ඇත්නම් කැවුංද පඤ්ඤං***
> ***අතමිට ඇතිනම් ගෑනුද පඤ්ඤං***
> ***ගමේ එලවළු විකුණු සයිමන් මුදලාලිගෙ උපහැරනයකින් ඔහු තිරය වසා දැම්මේය.***

ඇද වැටුණි. සගයා වහා නැගිට චතුරංගව අනෙක් පැත්තට පෙරලා වත්තම් කොට ගත්තේය. සගයා ඔහු දෙස බලාගෙන හඬන්නට විය.

එපා මල්ලි අඩන්න. සොල්දාදුවෙක්ගෙ අවසානය මේ වගේ තමයි. මල්ලිට පුළුවන් නේද තනියම කෑම්ප් එකට යන්න.

මට බෑ අයියේ. ඔයා නැතිව එක අඟලක් මම හෙල්ලෙන්නෙවත් නෑ.

අනේ මල්ලි මට වෙච්ච දේ අම්මලා අප්පච්චිලාට උනත් කියන්න කෙනෙක් ඉන්න එපායැ. මම මැරෙන්න ඉස්සර ඔයා මෙතනින් යන්න. මට තනියම මැරෙන්න ඕන මල්ලියේ මගේ අවසාන කැමැත්ත ඒකයි.

අයියට මේ කරපු දේට මම වාඩුව ගන්නවා අයියේ. මේ වෙනුවෙන් මම සීයක් මරනවා.

මල්ලි සොල්දාදුවෙක්ගේ හිතේ වෛරය පිළි-ගැනීම නෑ.

චතුරංග වේදනාවෙන් ඇඹරෙමින් කියා සිටියේය. විනාඩි කිහිපයකින් දගලීම අඩුවී පහත් හඬින් කථා කරන්නට විය.

මල්ලී උනුයි අපියි දක්ක තැන මරා ගන්නවා. උන් හිතනවා උන් හරි කියලා අපි හිතනවා අපි හරි කියලා. මිනී මරන එකට නීතියානුකූල බවක් කොයින්ද මල්ලි. කවුද හරි කියලා තීරණය කරන්නෙ ඉතිහාසයයි. අපි දෙගොල්ලොම රටක් වෙනුවෙන් මරා ගන්නවා. අපි කවුරුවත් දන්නෑ මල්ලි මේ රට උන්ගෙවත් අපේවත් නොවන වග.

චතුරංග ඉතාමත් අමාරුවෙන් කථා කරන්නට විය.

අනේ අයියේ අපි කෑම්ප් එකට යමු. අයියට කිසි දෙයක් වෙන්නේ නෑ.

සාලිය කඳුළු පිරි දෙනෙතින් පවසා සිටියේය. චතුරංග ඉතාමත් වෙහෙසින් යුතුව මුහුණට සිනාවක් ආරූඪ කරගත්තේය.

ඔහු සාලිය දෙස බලා එක් ඇසක් වසා ඉඟි කොට සිනාසුනේය.

ම-ල්-ලි උඹේ කි-රි කෑ-ල්- ල මතක් ක-රා-කි

චතුරංගට වැකිය අවසන් කිරීමට නොහැකි විය. ඔහුගේ දෙනෙත් ඈත රතු මිශ්‍ර දම් පැහැති වළාවක් දෙසට නිශ්චලව යොමුවී තිබුණි. දකුණත තමන්ගේ නලලතට ගෙන චතුරංගට ආචාර කොට තුවක්කු දෙක අක් දෙට ගෙන ඉදිරියට යන්න විය.

(අවසානයක් නොමැත)

හේමලාල් විද්‍යාරත්න
දුම්රිය ස්ථානාධිපති
රොසැල්ල.
lalvidya@yahoo.com